# හියාරේ වෙද පරපුරෙහි විශේෂිත වූ රෝග රෝගී පරීක්ෂා ක්‍රම

පාරම්පරික වෛද්‍ය එච්.කේ.ජී.ජගත් සිසිර කුමාර

ගාල්ල දිස්ත්‍රික්කයෙහි හබරාදූව ප්‍රදේශයේ සුප්‍රසිද්ධ ව සිටි මැටරඹ කනත්ත ගමගේ පියදාස වෙද මහතා මානසික වෙදකම, කැඩුම් බිඳුම් වෙදකම, මෙන් ම සර්වාංග වෙදකම සඳහා ද ප්‍රසිද්ධියක් ඉසිලූ දේශීය වෛද්‍යවරයෙකි. දැනට වසර 20ක පමණ සිට ඔහුගේ දෙවු පුතණුවන් විසින් මෙම පාරම්පරික චිකිත්සා ක්‍රමය රැකගෙන එනු ලබයි.

මෙම වෙද පරපුර සතු සුවිශේෂ ලක්ෂණයක් නම් රෝග රෝගී පරීක්ෂාවේ දී බොහෝ ක්‍රමවේදයන් භාවිත කිරීමයි.

- නාඩි ශාස්ත්‍රය මඟින් රෝග හඳුනා ගැනීම
- දිෂ්ටි ලක්ෂණ මඟින් රෝග හඳුනා ගැනීම
- දෙහි කැපීම සහ මන්ත්‍ර ශාස්ත්‍රය මඟින් රෝග හඳුනා ගැනීම
- ජ්‍යොතිෂ ශාස්ත්‍රය මඟින් රෝග හඳුනා ගැනීම
- විශේෂ මුත්‍ර පරීක්ෂාව රෝග හඳුනා ගැනීම
- වාස්තු විද්‍යාව මඟින් රෝග හඳුනා ගැනීම

**නාඩි ශාස්ත්‍රය**

පළමුව රෝගියා පැමිණි විට නාඩි ඇල්ලීම මඟින් තුන් දොස් වලින් හටගත් රෝගයක් ද, නැතහොත් "**දේව මානසික**" රෝගයක් ද යන්න වටහා ගනියි. දේව, යක්ෂ, ප්‍රේත, පිශාචාදීන්ගෙන් හටගන්නා රෝග දේව මානසික රෝග ගණයට වැටෙයි.

**දිෂ්ටි ලක්ෂණ**

ඉහත සඳහන් කළ පරිදි එක් එක් දිෂ්ඨීන් ( බලවේග ) සඳහා වන නොයෙක් ලක්ෂණ ශාස්ත්‍රයෙහි සඳහන් වේ.

"අකල් කැසිද ඔක්කාරද ගුල්ම ලෙඩයි...." මෙම කවිය මඟින් මහසොහොන් යකාගේ ලෙඩ ගැන කියවෙයි.

"ඇසිපිය නොසලා උඩට හෙලා නම්....." මෙම ලක්ෂණ ඇතිවේ නම් කළු යක්ෂයා( කළු කුමාරයා) හෝ රීරි යක්ෂයාගේ ලෙඩකි.

ඇඟ යටින් සීතල කර උණගැනී පලු හටගනියි නම් සන්නි යක්ෂයාගේ ලෙඩකි.

| | |
|---|---|
| හිසේ හටගත් දෙසිය දොළහක් පිළික බාධක ගෙඩි | විසල් |
| කණේ හටගත් කර්ණ ශූලය බිහිරි ගෙඩි සන්ධිද | සියල් |
| ඇසේ හටගත් සය අනූවක් පටල පණු කැවිලිද | විසල් |
| මෙසේ හැම ලෙඩ රෝග දුරු වෙයි තෙදැති පත්තිනි | වැඩියකල් |

**දෙහි කැපීම සහ වෙනත් මන්ත්‍ර ක්‍රම භාවිතය**

දෙහි කැපීමේදී වතුර මත පාවෙන දෙහි ගෙඩි පහක් ගෙන "කල්ලු ගාහේ දේස්....." යන මන්ත්‍රයෙන් ජීවම් කරනු ලබයි. අනතුරුව දෙහි කපා වතුරට දමයි. එක දෙහි පළුවක් යට අතට හැරී නැඹිලිය පතුලට යයි නම් එය මහසෝනාගෙන් හටගත් බන්ධනයකි.දෙහි පළු දෙකක් යටට යයි නම් එය රීරි යකාගෙ බන්ධනයකි. පලු නවයක් යටට යයි නම් ග්‍රහ අපල සමඟ බැඳුනු බන්ධනයකි. පළු දහය ම යටට යයි නම් රෝගියා සුව කළ නොහැක.

රෝග පරීක්ෂාව සඳහා මන්ත්‍ර ශාස්ත්‍ර භාවිතයේ විශේෂ අවස්ථාවක් පහත පරිදි දැක්විය හැකිය. පළමු ව පොල් ගෙඩියක් ගෙන කහ වතුරින් සෝදාගනු ලබයි. පසුව එම පොල් ගෙඩිය මන්ත්‍රවලින් දිෂ්ටි කිරීම, සිද්ධි කිරීම, ප්‍රාණ කිරීම, ජීවම් කිරීම සහ පුට කිරීම සිදු කරයි.

අනතුරුව එය බුලත් කොළයක් මත තබා හඳුනා ගැනීමට ඇති අවශ්‍යතාවයන් තුණ්ඩුවල ලියා පොල්ගෙඩිය වටේට තබනු ලැබේ. පොල් ගෙඩිය මත බිම ස්පර්ෂ නොවන පරිදි තෝරාගත් පුද්ගලයකු වාඩි කරවනු ලැබේ. එවිට අදාළ දිෂ්ටි බන්ධනය සහිත තුණ්ඩුව දෙසට පොල්ගෙඩිය කරකැවෙයි.

මෙහි ක්‍රියාත්මක වීම සිදු වීමට පොළොව, පොල් ගෙඩිය, පුද්ගලයා යන තුන ම සමඟ භූත බලවේගය සම්බන්ධ විය යුතු ය. බාහිර බලවේගය මඟින් කරකැවීම සිදු කරයි.

ප්‍රතිකාර කිරීමේ දී එක් එක් දෝෂය හඳුනාගෙන ඊට අදාළ පිළිවෙත සිදු කළ යුතු ව ඇත. වෛද්‍යවරයා විසින් එම පිළිවෙත සිදු කරනු ලබයි. කළු යක්ෂයාගේ රෝග සඳහා කළු යක්ෂයාට අයිති දොළ පිදේනි දීම, මන්ත්‍ර කිරීම කළ යුතු ය.

මහසෝනාගේ ලෙඩට සන්නි යකාගේ පිළිවෙත් කිරීමෙන් ද, සන්නි යකාගේ ලෙඩට මහසෝනාගේ පිළිවෙත් කිරීමෙන් ද, රෝග තත්වය උත්සන්න වෙයි. තව ද උදාහරණයක් ලෙස ඉරමුදුන් යක්ෂයාගේ රෝගයේ දී ඉරමුදුන් සමයමට පමණක් දොළ පිදේනි දීම කළ යුතුය. එහි දී ස්ථානය, නැකත, වේලාව සහ හෝරාව බලපානු ලබයි.

**ජ්‍යෝතිෂ ශාස්ත්‍රයේ භාවිතය**

රෝගීන්ගේ ග්‍රහචාරය බැලීම ද සිදු කරනු ලැබේ. අසුභ ග්‍රහ තත්ත්වයක් පිහිටියේ නම් ඒ ඒ ග්‍රහයන්ට අනුව ලක්ෂණ පහළ වේ. උදාහරණයක් ලෙස හිසේ රෝග, කේන්ති ගතිය සහ අස්ථි කැඩීම රවිගේ දුර්වලතා නිසා සිදු වේ.

''අෂ්ට මන්තේ දශා චන්ද්‍රදෙස මන්තේ දිවාකරං

සප්ත මන්තේ මහී පුත්‍රං ඒවං ප්‍රාණ හානිකරං''

චන්ද්‍රයාගේ දශාවේ දී සෙනසුරු අටෙහි ගමන් කරයි ද, රවිගේ දශාව ඇති කල සෙනසුරු 10හි ගමන් කරයි ද, අඟහරු දශා කාලයේ දී සෙනසුරු 07හි ගමන් කරයි ද,එය රෝගියාගේ ප්‍රාණය හානි කිරීමට හේතු වේ. රාහු 03, 11, බලවත් නම් සැඩ සුළඟට හසු වූ පුළුන් රොදක් සේ මාරක නැති වී යා හැක.

**විශේෂ මූත්‍ර පරීක්ෂාව**

රෝගියාගේ මූත්‍ර ගෙන තල තෙල් මතුරා එම මුත්‍රවලට දැමූ විට යන දිශාව සහ ඇති වන රූප මගින් රෝගකාරකය හඳුනාගත හැකිය. උදාහරණ ලෙස තල තෙල් යටට හෝ බටහිරට යාමේ දී රෝගියා සුව කළ නොහැක. ඊසාන දිශාවට යයි නම් පිතෙන් සහ ගුරුගේ අපලයෙන් හටගත් රෝගයකි.

වඳුරු හෝ රිලා හැඩය මතු වේ නම් රීරි යකාගෙන් හටගත් ලේ රෝගයකි.

ඌරාගේ හැඩය නම් මහසෝනාගෙන් හටගත් පිත් අධික රෝගයකි. හලඹ මතු වීම දේව උදහසකි. ඉර හඳ මතු වීම ග්‍රහ දෝෂයකි.

**නිවාස පරීක්ෂාව මඟින්**

වාස්තු විද්‍යාව භාවිත කර රෝග කාරකය හඳුනා ගැනීම සිදු කරයි. ප්‍රධාන ලණුව ගිනිකොනට ගසා ඇත්නම් නිවස ගිනිකොන දිශාවට ඇරී ඇත. එවිට එම නිවැසියාට වාත රෝග හට ගනියි. වාස්තු විද්‍යාවේ සඳහන් වාස්තු මර්ම 144න් ප්‍රධාන 34 පමණක් බැලීම සිදු කරයි. නිවාසයට නැගෙනහිරින් යම් ඉදිකිරීමක් තිබී යම් අවහිරතාවක් වේ නම් එම නිවැසියන්ට මානසික රෝග ඇති විය හැකිය.

ඉහත සඳහන් ආකාරයට මෙම වෙද පරපුර විසින් ප්‍රතිකාර කිරීමේ දී හා රෝග නිර්ණය කිරීමේදී විවිධ ක්‍රම උපයෝගී කරගැනීම සුවිශේෂී ලක්ෂණයකි.